# වාර්ෂික වාර්තාව

# 2011



**උද්භිද උද්‍යාන භාර අරමුදල**

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

**පේරාදෙණිය**

# ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුබ සාධනය සඳහා භාර අරමුදල

## වාර්ෂික වාර්තාව - 2011 (Annual Report – 2011)

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුබ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 1995-12-15 දිනැති සංදේශය සලකා බලා 1996-02-07 දින පැවති අමාත්‍ය මණ්ඩල රුස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුබ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යාන සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුබ සාධනය සඳහා භාර අරමුදලට ආදායම වශයෙන් වෙන් කරනු ලබන අතර, මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය එය වේ. ඊට අමතරව අරමුදල ආදායම වැඩිකර ගැනිම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනිමට ඉඩකඩ සලසා ඇත.

### උද්භිද උද්‍යාන භාර අරමුදල

1. අරමුදලේ නම : ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුබ සාධනය සඳහා භාර අරමුදල
2. ස්වභාවය : උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මූල්‍ය සහාය ලබාදීම
3. අදාල චක්‍රලේඛයන් :
   I) අරමුදල ආරම්භ කිරිම - 1917 අංක 09 දරණ අරමුදල් ආඥා පනත අනුව
   II) ගිණුම් තැබිම හා ගිණුම් වාර්තා කිරිම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරණ චක්‍රලේඛය.
4. ආරම්භ කළ දිනය : 1996 දෙසැම්බර් 20
5. කාර්යාලය : පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය
6. බැංකුව : පේරාදෙණිය ලංකා බැංකුවේ ගිණුම් අංක 0007040848

**7. අරමුදලේ පරමාර්ථ:**

අ) ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල් තුල උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තවදුරටත් යහපත් කිරිමේ ක්‍රියා මාර්ග ගැනිම.

ආ) පාරිසරික අධ්‍යාපනික හා ශාක පිළිබඳව දැනට පවත්නා සංරක්ෂණය සම්බන්ධයෙන් අර්ථාන්විත වැඩ සටහන් ක්‍රියාත්මක කොට දියත් කිරීම.

ඇ) උද්භිද උද්‍යානයන්හි සේවා නියුක්ත විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක දැනුම ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩි දියුණු කිරිම මෙන්ම අදාල කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනිමට මුල්‍යමය ආධාර සැපයිම.

ඈ) ශාක එකතුව පිළිබඳවද වර්ධනාත්මක වැඩ පිළිවෙලක් ඇති කිරීම.

ඉ) උද්භිද උද්‍යානයන්හි ප්‍රයෝජනය සඳහා පාරිසරික අධ්‍යාපනික සංරක්ෂණ හා වැඩි දියුණු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් කාර්මික ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරකම් වර්ධනය කිරීම හා ඊට ආධාර කිරීම.

ඊ) විද්‍යාඥයින්ට හා උද්භිද උද්‍යානයට පැමිණෙන අයට අවශ්‍ය පහසුකම් සැපයිම සඳහා අවශ්‍ය ඕනැම හදිසි ඉදි කිරිමේ කටයුත්තක් භාර ගැනිම.

උ) විශේෂිත වැඩ සටහනකදී පුනරාවර්තන අරමුදල් හිඟය පියවා ගැනිම.

**අරමුදලේ ප්‍රතිපාදනය යොදා ගනිමින් 2011 වර්ෂයේ ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන්**

- උද්භිද උද්‍යාන අලංකරණ වියදම යටතේ උද්‍යාන නඩත්තු කටයුතු කරගෙන යාම සඳහා කම්කරු ශ්‍රමය ලබා ගැනිම සඳහා පුනරාවර්තන වියදම් ප්‍රමාණවත් නොවු හෙයින් අරමුදල යටතේ රු මිලියන 4.6 ක වියදමක් දරා ඇත.





- උද්භිද උද්‍යානවල පහසුකම් වැඩි දියුණු කිරිම යටතේ සේවයේ නියුතු උද්භිද උද්‍යානවල විවිධ මට්ටමේ තනතුරුවල සේවකයින් පුහුණු කිරීම. නිල ඇඳුම් ලබා දීම, මල් පැල බීජ රෝපණ ද්‍රව්‍ය සහ පුස්තකාල පොත් දේශිය විදේශිය වෙළඳපලින් ලබා ගැනිම සිදු කර ඇත.

- පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පාරවල් සංවර්ධනය යටතේ අභ්‍යන්තර මාර්ග කි.මී. 1.062 ක් මධ්‍යම පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සංවර්ධනය කර ඉටු කරවා ගෙන ඇති අතර ඒ සඳහා අරමුදල යටතේ රුපියල් මිලියන 13.7 ක වියදමක් දරා ඇත.



- පේරාදෙණිය උද්භිද උද්‍යානයේ ඩී.ටී. ඒකනායක අනුස්මරණ දේශනාගාරය නවීකරණය කිරීම. මේ සඳහා අරමුදල යටතේ රු 868,489.00 ක වියදමක් දරා ඇත.





- ගම්පහ උද්භිද උද්‍යානයේ ජා - ඇල මාර්ගයෙන් පිවිසෙන පිවිසුම් දොරටුව පස් පුරවා සංවර්ධනය කිරීම. මේ සඳහා අරමුදලින් රු 811,000.00 වියදමක් දරා ඇත.



- ජාතික ශාකාගාරයේ උද්භිද විද්‍යාත්මක පර්යේෂණ කටයුතු සඳහා රුපියල් මිලියන 2.1 ක වියදමක් දරා ඇත. මේ යටතේ ශාක සංරක්ෂණ කටයුතු සඳහා අධි ශීතකරණයක්ද, ශාක වර්ග වල විවිධ පර්යේෂණ කටයුතු පහසු කර ගැනීම පිනිස විශේෂිත කැමරාවක්ද මිලදී ගෙන ඇත.







- උද්භිද උද්‍යාන අලංකාර ලෙස නඩත්තු කිරිම පිණිස නව තාක්ෂණය භාවිතා කිරිම් කටයුතු කල අතර, ඒ යටතේ ගස්වල අතු බිම සිට කප්පාදු කල හැකි යන්ත්‍ර සහ වැටවල් අලංකාර ලෙස කප්පාදු කල හැකි "හෙජිං මැෂින්" සහ තණ පිට්ටනි මනා ලෙස නඩත්තු කිරිම සඳහා සුදුසු වර්ගයේ තණකොල කපන යන්ත්‍ර උද්භිද උද්‍යානවලට මිලදී ගෙන ඇත. මේ සඳහා අරමුදල යටතේ රුපියල් මිලියන 4.1 ක වියදමක් දරා ඇත.







## අරමුදල යටතේ කරන ලද 2011 වර්ෂය තුල ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන් පිළිබඳ සාරාංශය

| කාර්යය | වියදම (රු) |
|---|---|
| 1. උද්භිද උද්‍යාන පහසුකම් වැඩි දියුණු කිරිම, උද්‍යාන අලංකරණ කටයුතු | 4,651,018.00 |
| 2. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග සංවර්ධනය | 13,715,707.00 |
| 3. ගම්පහ උද්භිද උද්‍යානයට ජා ඇල මාර්ගයෙන් පිවිසුම් දොරටුව සංවර්ධනය | 811,000.00 |
| 4. ජාතික ශාකාගාරය උද්භිද විද්‍යාත්මක පර්යේෂණ කටයුතු | 2,170,171.00 |
| 5. උද්භිද උද්‍යාන නඩත්තු කටයුතු සඳහා නවීන යාන්ත්‍රික උපකරණ මිලට ගැනිම | 4,951,943.00 |
| 6. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ඩී.ටී.ඒකනායක අනුස්මරණ දේශනාගාරය නවීකරණය කිරීම. | 868,489.00 |

ආචාර්ය පී.බී. ජයසුන්දර
සභාපති, උද්භිද උද්‍යාන භාර අරමුදල සහ
ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ආචාර්ය ඩී.එස්.ඒ විජේසුන්දර
ලේකම්. උද්භිද උද්‍යාන භාර
අරමුදල, සහ
අධ්‍යක්ෂ ජනරාල් ,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.